

# අඬන කුඩේ

විහඟි පොද්දල්ගොඩ

5E

# අඩන කුඩේ

ISBN-978-624-206-586-1

කතාව හා චිත්‍ර :

විහඟි පොද්දල්ගොඩ

5E

මහාමායා බාලිකා විදුහල

මහනුවර

2023.11.15

# පිදුම

අඬන කුඩේ සිතුවිල්ල මා
වෙත ගෙන ආ මා
ආදරණීය මහමායා විදු
මාතාවට බැතියෙන්
පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීම්යි. ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියනියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කරගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි."

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දින විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අදත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩල,ගුරුභවතුන් දෙමාපියන් , ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය ,මහනුවර

2023. 11.01




එක දවසක් මම
ඉස්කෝලෙ ගියා.
හවස ගෙදර ආවට
පස්සෙ මගේ කුඩේ නෑ.
මම හැමතැනකම
හෙව්වා.
කොහෙවත් මගේ කුඩේ
නැහැ.
“කෝ මගේ කුඩේ?” මම
කල්පනා කළා.




“ හපොයි!!! !!!

මම කුඩේ පන්තියේ දාලා


ඇවිල්ලනේ.”





මගේ යාළුවෝ පන්තියේ
කුඩේ තියනවා දැකලා.
ඒක මට දෙන්න
හැමතැනකම මාව
හොයලා.
ඉතින් මම නැති නිසා
යාළුවෝ කුඩේ පන්තියේ
ම තියලා.



හවස් වුණා. මට කුඩේ
මතක් වුණා.
“හෙට බදාදා.
හෙට නිවාඩු.
ඒ නිසා මට කුඩේ
ගේන්න වෙන්නේ
බ්‍රහස්පතින්දා.
මට ඒ ගැන ගොඩක්
දුකයි.
“කුඩේට පාළු ඇති.” මට
හිතුණා.



මගේ කුඩේ වටපිට
බැලුවා.
“කවුරුත් නැහැනේ.”
කුඩේට හිතුණා.
“අයියෝ, මට හරි පාළුයි.
කවුරුත් නැද්ද?”
කුඩේ අඬන්න ගත්තා.
“විහඟි බබා, අනේ විහඟි
බබා ඔයා නැද්ද?”



කුඩේට හරි දුකයි.

ඉතින් එයා අඬ අඬ

ඉන්නකොට රාක්කෙ

තිබුණ

පැන්සල්,මකන,අඩි

රැල්,කටර්,පුංචි

පොත්,පාට

පැන්සල්,කතුරු,ගම්

බෝතල්, පාට


පෙට්ටි..........

මෙයාලටත් දුක හිතුණා.

මගේ කුඩෙ යාළුවෝ
ළඟට ගියා.

යාළුවෝ දැක්කා මගේ
කුඩෙ එනවා.

එයාලා ඉක්මනට දුවලා
ගිහින් කුඩෙ බදාගත්තා.
“අනේ ඔයා විහඟිගේ
කුඩෙ නේද?
එන්න එන්න, අපි
සෙල්ලම් කරමු.”
යාළුවෝ කීවා.



“මට සෙල්ලම් කරන්න
හිතෙන්නේ නෑ.
මට විහඟිව ඕන.”කුඩේ
කිවා.
“අපිටත් අපේ බබාලාව
මතක් වෙනවා.ඒත් අපි
මොකද කරන්නේ?
විහඟිගේ කලබලේට
ඔයාව අමතක වෙන්න
ඇති.

ඒත් එයා ඔයාට

ආදරෙයි.” හිමාෂා ගේ

පාට පෙට්ටිය කිව්වා.”

ඔය ඇත්තද?”

කුඩේ ඇහුවා.

“ඔව් .දැන් හැමෝම


නිදාගන්න.”

ඉසුරිගේ ගම් බෝතලේ


කිව්වා.

ඉතින් හැමෝම

නිදාගත්තා.



මගේ කුඩේ නිදාගත්තේ
නෑ.අඬ අඬා හිටියා.
මගේ කුඩේ උදෙන්ම
නැගිට්ටා.
යාලුවොත් නැගිට්ටා.
ඒගොල්ලෝ ගිත්මාගේ
පොඩි පොතේ චිත්‍ර
ගොඩක් ඇඳලා පාට පාට
පින්තූර අලවලා ,බෝල
කපලා .



මගේ කුඩේ නම්
මොනවත් කරලා නෑ.
එයා දුකෙන් පැත්තකට
වෙලා ඉඳලා.

උදේ හත වෙනකොට
ළමයි ඉස්කෝලේ ආවා.
යාළුවෝ එක් එක්කෙනා
රාක්කවලට ගියා.
සෙල්ලම් කරන එක
නැවැත්තුවා.


“අපි අද රටත් සෙල්ලම් කරමු.” යසඳි ගේ කතුර යාලුවොත් එක්ක කතා වුණා.

එතකොටම මම පන්තියට ආවා.

යාළුවො කීවා , “අන්න විහඟි ආවා.....අන්න විහඟි ආ..වා..”

විහඟි බබා ඔයා ආවාද ?”

කුඩේ කැගහගෙන
වේගයෙන් දුවගෙන
දුවගෙන ආවා.
විහඟී එක පිම්මට ඇවිත්
කුඩේ බදාගත්තා.
“ආපහු කවදාවත් මාව
දාලා යන්න එපා”
කුඩේ කිව්වා.
“මම කවදාවත් ආපහු
ඔයාව දාලා යන්නේ
නෑ.”



එදා හවස ගෙදර එන විට ගොඩක් වැස්සා .

මම සතුටින් කුඩේ ඉහලාගෙන ගෙදර ගියා.

ඊට පස්සේ මම කවදාවත් කුඩේ දාලා ගියේ නැහැ.

ආපහු කුඩේ ඇඹුවෙත් නැහැ.

ඊට පස්සේ දෙන්නා සතුටින් ආදරයෙන් හිටියා.

නිමි



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතය ට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයෙන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත් පොතපතට සමීප කිරීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක ව වර්ධනයක් ඇතිකිරීම , ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී . ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුනුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැලසුම්කරුවන්ට මෙන්ම සමාජය වගකීම් වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි . පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියෙහි ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි

“දිවිය දිනන විද්‍යුත් පොතක් “ ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කිරීමට ඩිජිටල් වේදිකාවට පිවිසි ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට හැකියාව ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ

නිර්මාපක

2023.11.-01